**ජාතික ඔලිම්පික් කමිටුව - 2020**

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1. මතය**

--------

ජතික ඔලිම්පික් කමිටුවේ ("කමිටුව") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**

-------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ඔලිම්පික් කමිටුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කමිටුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ජාතික ඔලිම්පික් කමිටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කමිටුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කමිටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කමිටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කමිටුව ක්‍රියා කර ඇති බව,

- කමිටුවේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- කමිටුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ක්‍රීඩා නීතිය, 1973 අංක 25 සහ 1993 ජුනි 29 දිනැති අංක 773/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | දේශීය හා ජාත්‍යන්තර ප්‍රදානයන් සම්බන්ධයෙන් ජාතික ඔලිම්පික් කමිටුව විසින් කාර්තුමය වශයෙන් පිළියෙල කරන ලද වාර්තා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුවේ. කෙසේවෙතත්, 2020 වර්ෂය සඳහා දේශීය වශයෙන් ලැබී තිබුණු රු. 25,219,095 ක අරමුදල් හා ජාත්‍යන්තර වශයෙන් ලැබුණු රු. 119,358,672 ක් වූ ප්‍රදානයන් පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට කමිටුව කටයුතු කර නොතිබුණි. | 1973 වර්ෂයේදී ක්‍රීඩා නීතිය නීතිගත කිරීමට පෙර ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව ජාත්‍යන්තර ඔලිම්පික් කමිටු අනුමත ව්‍යවස්ථාවෙන් (1973 දී පිහිටුවන ලද) පාලනය වන අතර පුරුද්දක් වශයෙන් මාසික රැස්වීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කර ඇත.<br>සියලුම ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් නිසි කාලරාමුවක් යටතේ ජාත්‍යන්තර ආයතන සමඟ එකඟතාවයන් මත ක්‍රියාත්මක කෙරේ. ජාත්‍යන්තර වශයෙන් හෝ දේශීය වශයෙන් යන කුමන ආකාරයකින් අරමුදල් ලැබුණද, අප විසින් ක්‍රීඩා හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් නිසි ලෙස හා ඵලදායී අයුරින් සැලසුම් කරනු ලැබේ. | ක්‍රීඩා නීතියට අනුව දේශීය හා විදේශීය වශයෙන් ලැබෙන ප්‍රදානයන්සම්බන්ධයෙන් ජාතික ඔලිම්පික් කමිටුව විසින් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත කාර්තුමය වශයෙන් වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,329,390ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,356,744 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.38.686,134 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් වියදම් රු. 50,032,411 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ජාතික ඔලිම්පික් කමිටුව යටතේ ජාතික සම්මේලන තිස් හතරක් ලියාපදිංචි කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සම්මේලන 34න් 32 ක ගෙවීම් සඳහා වාර්ෂික ප්‍රදානයන් සඳහා රු. 6,400,000 ක මුදලක් වෙන් කර තිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය ආරම්භ වනවිට පෙර වර්ෂවල නොගෙවූ ප්‍රතිපාදන රු. 8,630.074 ක අගයක් විය. එසේ වුවද, ලියාපදිංචි සම්මේලන වෙත ප්‍රදානයන් ලබාදීම සඳහා අදාළ ලේඛන ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස එකතුව රු. 5,227,217 ක මුදලක් සමාලෝචික වර්ෂය අවසාන වන විට කාරක සභාව විසින් රඳවාගෙන තිබුණි. පාලන ආයතනය වශයෙන් තත්ත්වය පරීක්ෂා කිරීමට කමිටුව විසින් කටයුතු කර නොතිබුණි. | කමිටුව විසින් අනුමත කරන ලද ක්‍රියා පටිපාටිය ජාතික සම්මේලනයන්හි අවශ්‍යතාවයන්ට අනුකූල වියයුතු අතර, වර්ෂය තුළ ඔවුන්ගේ ප්‍රදාන සහ ව්‍යාපෘති සම්බන්ධ වියදම් සඳහා එය යොදාගත යුතුය. ජාතික සම්මේලනයන්ගේ රේඛීය නොවන හා ඔවුන්ගේ ප්‍රදාන හෝ ව්‍යාපෘති සම්බන්ධ වියදම් දරන්නේ නම්, ජාතික ඔලිම්පික් කමිටුව විසින් අරමුදල් මුදාහැරීමට හෝ ජාතික සම්මේලනවල එවැනි ක්‍රියා සඳහා වගකීමට නොබැඳේ. එබැවින් ජාතික ඔලිම්පික් කමිටුව කිසිඳු මුදලක් ලබා දී නොමැති බවට හා ඒ වෙනුවට ජාතික සම්මේලනයන් පිළිබඳ අවධානය යොමු නොකොට ඔවුන්ගේ ප්‍රදානයන් රැස්කර නොමැති බවට වන අදහසට එකඟ නොවෙමු. | ජාතික ඔලිම්පික් කමිටුව අදාල ලියකියවිලි ලබාගැනීමෙන් පසුව සාමාජික සම්මේලනයන් වෙත ප්‍රදානයන් මුදාහැරිය යුතු අතර, පාලන ආයතනය ලෙස තත්ත්වය පරීක්ෂා කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | 2017 වර්ෂයේ සිට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 517,784 ක මුදලක් පියවීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට මෙම වටිනාකම ගෙවිය යුතු/වගකීම් ලෙස පොත්වල ඉදිරියට ගෙන යන ලදී. කෙසේවෙතත්, මේ සම්බන්ධ කිසිඳු වාර්තාවක් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතුව | ගෙවිය යුතු මුදල් කඩිනමින් ගෙවීම සඳහා පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | නොමැති අතර, ඉදිරි වර්ෂයේදී මේ සම්බන්ධයෙන් නැවත වාර්තා කිරිමට කටයුතු කරන්නෙමු. මෙම වගකීම් සම්බන්ධයෙන් කිසිදු දෝෂයක් දක්නට නොමැත. | |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරවීම සඳහා ජාතික ඔලිම්පික් කමිටුවේ විධායක කමිටුව විසින් වෙනම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් සකස් කර අනුමත කර තිබුණි. කෙසේවෙතත්, එම මාර්ගෝපදේශය සඳහා කරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම, ප්‍රසම්පාදන සැලසුම්, ලංසු තැබීමේ කාලසීමාව, ලංසු ඇගයීමේ නිර්ණායක, ප්‍රසම්පාදන සඳහා අත්තිකාරම් ගෙවීම්, කාර්යසාධන සුරක්ෂිතභාවය, කොන්ත්‍රාත් සඳහා රඳවාගැනීම්, එකතු කළ අගය මත බදු සඳහා ගෙවීම්, ලංසු තැබීම්, ඇවර කළ හානි හා ගිවිසුම් ප්‍රදානය වැනි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සැලකිය යුතු කරුණු කිහිපයක් ජාතික ඔලිම්පික් කමිටුව විසින් වෙනම සකස් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේහයට ඇතුළත් කර නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සකස් කර ඇති අතර, එය විධායක කමිටුව විසින් අනුමත කර ඇත. කිසිදු ආකාරයකින් එම මාර්ගෝපදේශයන් උල්ලංගනය කර නොමැති බැවින් වෙනත් අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. | සියලුම වැදගත් සංරචක ඇතුලත්ව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සකස් කර තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමට කඩනමින් කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කමිටුව වෙත කාර්ය මණ්ඩලය බඳවාගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | විශාල වශයෙන් ලාභ ලබන ක්‍රියාකාරකම් සිදු නොවන අතර, එබැවින් පොදු කාර්ය පිරිවැය අවම කරගැනීමේ අරමුණින් අවම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යනු ලැබේ. කිසියම් නව කාර්යයක් හෝ සිදුකරන ලද ව්‍යාපෘති මත පදනම්ව අවශ්‍ය නම්, විධායක කමිටුවේ අනුමැතිය සහිතව නිසි පරික්ෂණයක් සිදුකර බඳවාගැනීම් සිදුකරනු ලැබේ. මෙය දැනට ජාතික ඔලිම්පික් කමිටුව විසින් ඉටුකළ යුතු අවශ්‍යතාවයක් ලෙස නොදකින අතර, හැකි සෑම විටම ව්‍යාපෘති සඳහා ස්වේච්ඡා පදනම මත සේවකයන් බඳවාගනු ලැබේ. | ඵලදායී මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා බඳවාගැනීම් හා සේවක සංඛ්‍යා පිළිබඳ යෝජනා ක්‍රමයක් සකස් කර අනුමැතිය ලබාගත යුතුය. |

**4.** **වගවීම හා යහපාලනය**

---

**4.1 සංයුක්ත සැලැස්ම**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කමිටුව විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | වර්ෂයෙන් වර්ෂයට විවිධ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සඳහා අවධානය යොමු කෙරෙන බැවින් මෙම ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට හැකියාවක් නොමැත. ප්‍රධාන වශයෙන් වසරින් වසර වෙනස් වන විවිධ ක්‍රීඩා සඳහා ලැබෙන ප්‍රදානයන් හා පරිත්‍යාග තුළින් සංවිධානය ක්‍රියාත්මක වේ. යථාර්තවාදී නොවන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම තුළින්ම ආයතනය අකාර්යක්ෂම වේ. | කමිටුවේ ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |